රොක්බෑන්ක්හි පාරමිතා
බෞද්ධ විහාරවාසී,
මහනුවර අස්ගිරි මහාවිහාර
මහ පිරිවෙණෙහි ආචාර්ය
**ඉඳිපරපේ ධම්මසිරි හිමි**





# ගුණ නැණ බෙලෙන් යුතු පිරිපුන් මිනිසුන් බිහි කළ අපේ ධර්ම සාහිත්‍යය - 02

සාහිත්‍යයක් බිහිවීමට නම් ප්‍රබල භාෂාවක් තිබිය යුතුය. මිනිසාගේ මුල් අවධියේ පටන් අදහස් හුවමාරු කර ගැනීමට භාවිත වූ භාෂාව නූතන සමාජයේ පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයකි. ආරම්භයේ දී රූප සටහන් මගින් සිය සන්නිවේදන අවශ්‍යතා සපුරාගත් ආදි මානවයා අනුක්‍රමයෙන් ශබ්ද සංකේත හෙවත් අක්ෂර නිපදවාගෙන භාෂා සම්ප්‍රදායයන් ගොඩනගා ගත්හ. මහින්දාගමනයට පෙර ලංකාවේ ප්‍රාකෘත වැනි මූලික භාෂාවන් භාවිත වූ අතර පසුකාලීන ව සංස්කෘත හා පාලි යන මාතෘ භාෂාවන්ගෙන් පෝෂණය ලැබූ සිංහල භාෂාව වත්මන් ස්වරූපයට පත්වීමට සියවස් තිහකට ආසන්න කාලයක් ගත වී ඇතැයි අනුමාන කළ හැකිය. අනුරපුර යුගයේ සිට මේ දක්වා භාෂා පරිණාමය විමසා බැලීමේ දී කලින් කලට විවිධ වෙනස්කම් සිදු වී ඇත. ඒ ඒ යුගයන්හි භාවිත වූ භාෂා රටාවන් පිළිබඳ සාහිත්‍ය කෘති විමර්ශනයේ දී පැහැදිළි කර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

සාහිත්‍යය නියමාකාරයෙන් රස විඳින්නට නම් භාෂාව හා එහි භාවිත වන වචන පිළිබඳ

*ඕස්ට්‍රේලියාව වැනි රටක සිංහල සාහිත්‍ය කෘතියක් ඇස නොගැටෙන, සුභාවිත සිංහල ගීතයක රස විඳ නැති, ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනුම ලබන අපේ දරුවන් ආදරය හඳුනා ගන්නේ හැඟීම්වලින් නොව භාෂාවෙන්ය.*

සාමාන්‍ය දැනුමක් හෝ තිබිය යුතුය. භාෂා දැනුමෙන් තොර සාහිත්‍ය රසවින්දනයක් පිළිබඳ කථා කළ නොහැක. වචනවල ඇති මතුපිට සරල තේරුම හෝ අදහස මෙන් ම ගැඹුරු හෝ යටි අදහස් ද තේරුම් ගැනීමේ හැකියාව සාහිත්‍ය රසකාමියා සතු ව තිබිය යුතුමය. සරල නිදසුනක් ඇසුරෙන් මෙය වටහා ගනිමු.

වත්මන් සමාජයේ බහුල ව භාවිත වන වචනයකි 'ආදරය'. එහි සරල තේරුම එකිනෙකා කෙරෙහි ඇති බැඳීම, ළෙන්ගතු බව, එක් ව සිටීමට ඇති කැමැත්ත යනාදී වශයෙන් විවිධාකාරයෙන් අර්ථකථනය කළ හැකිය. මේ වචනය සෑදී ඇත්තේ සංස්කෘත භාෂා මූලයකිනි. ආ යන උපසර්ගය මුලට යෙදී දෘ ධාතුවෙන් තැනෙන ආදර යන්නෙහි සැබෑ අර්ථය වන්නේ තැකීම, සැලකීම, ගරු කිරීම යන්නයි. යමෙකුට, තමා කැමති අයෙකුට මේ ගුණාංගයන් අවංක ව දැක්විය නොහැකි නම් එහි සැබෑ ආදරයක් නැත. අප අයත් පෙරදිග සංස්කෘතිය තුළ ස්ත්‍රී පුරුෂයන් අතර විවාහයට පෙරත් පසුත් පැවතුණේ එවන් ආදරයකි. ආදරය යන වචනය එහි පරිසමාප්ත අර්ථයෙන් ම සිය හදවත් තුළින් මෙන් ම ජීවන පැවැත්ම තුළින් ද අපේ පැරැණි සමාජය ප්‍රකට කළේය. එහෙත් වර්තමානයේ එය අපරදිග සංස්කෘතියේ ලක්ෂණ උකහා ගනිමින් හුදෙක් කායික බැඳීමකට සීමා වී ඇති බවක් පෙනේ. මෙය වඩාත් හොඳින් පැහැදිලි වන්නට ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය LOVE යන්නට සපයා ඇති අර්ථකථනයන් කිහිපය විමසා බැලීම ප්‍රයෝජනවත්ය.

Love

affection : a strong feeling of deep affection for somebody / something, especially a member of your family or a friend.
affection : a strong feeling of deep affection for smb that you are sexually attracted to
enjoyment : a strong feeling of enjoyment that smt gives you
smb/smt you like : a person, a thing or an activity that you like very much

වර්තමාන තරුණ තරුණියන් අතර දක්නට ඇත්තේ මෙහි දෙවැනියට සඳහන් කළ ලිංගික ආකර්ෂණය සහිත බැඳීමයි. එහෙත් එය තාවකාලිකය. ලිංගික ආකර්ෂණයකින් තොර ව ආදරයක් පැවතිය නොහැකිය. එහෙත් එය සම්පූර්ණ ආදරය නොවේ.

ඕස්ට්‍රේලියාව වැනි රටක සිංහල සාහිත්‍ය කෘතියක් ඇස නොගැටෙන, සුභාවිත සිංහල ගීතයක රස විඳ නැති, ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙනුම ලබන අපේ දරුවන් ආදරය හඳුනා ගන්නේ හැඟීම්වලින් නොව භාෂාවෙන්ය. තමන් හැදුණු වැඩුණු සංස්කෘතියට අනුව ආදරය තේරුම් ගන්නා ආකාරය ඔවුන්ගේ ඉදිරි අනාගතයට එතරම් හිතකර නොවනු ඇත. ආදරය යනු හුදෙක් කායික බැඳීමක් පමණක්ය යන අදහසින් ක්‍රියා කිරීමෙන් ඔවුන් තුළ ඇති මානුෂික හැඟීම් යටපත් වීමට හැකිය. අපේ පැරණි බණ පොතින් ආදරයේ සැබෑ අර්ථය විදහා දක්වන තැන් පසුවට ඉදිරිපත් කෙරෙන අතර ඒවා ඔබේ දරුවන්ට අවබෝධ කර දීමට හැකිනම්, සිංහල සාහිත්‍යයේ රස විඳගෙන සැබෑ මිනිස් ගුණදහම් ගොඩනගාගන්නට ඔවුන් තුළ පෙළඹීමක් ඇතිවේයයි සිතමු. මේ අනුව යම් කිසි වචනයක්, අදහසක් තේරුම් ගැනීමේ දී භාෂා දැනුම යන්න වඩාත් අත්‍යවශ්‍ය සාධකයක් බව පැහැදිළි වේ. මීළඟට අපගේ අවධානය යොමුවන්නේ ශ්‍රී ලාංකීය ධර්ම සාහිත්‍යයේ ආරම්භය සහ විකාශනය සිදු වූ ආකාරය අනුපිළිවෙලින් හඳුන්වා දීමටය.

මහින්දාගමනයෙන් පසුකාලීන ව ඇරඹුණු ලාංකීය සාහිත්‍ය ඉතිහාසය ප්‍රධාන වශයෙන් යුග දහයකට බෙදේ.

1 අනුරාධපුර යුගය
2 පොළොන්නරු යුගය
3 දඹදෙණි යුගය
4 කුරුණෑගල යුගය
5 ගම්පොළ යුගය
6 කෝට්ටේ යුගය
7 සීතාවක යුගය
8 මහනුවර යුගය
9 කොළඹ යුගය
10 නූතන යුගය

මහින්දාගමනයට පෙර සංස්කෘත, ප්‍රාකෘත වැනි භාෂාවලින් ලියැවුණු රාවණා රජතුමන්ගේ ශිවතාණ්ඩව වැනි කෘතීන් පිළිබඳ සඳහන් වුව ද අපගේ මාතෘකාව වන්නේ ධර්ම සාහිත්‍යය බැවින් ආරම්භ කළ යුත්තේ අනුරාධපුර යුගයෙනි. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩමවීමෙන් පසුව දෙවනපෑතිස් රජතුමන් මහාවිහාරය කරවා ශාසනික මූලස්ථානයක් ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය සියලු පහසුකම් සපයා දුන් බවත්, ලක්දිව පුරා ම යොදුනෙන් යොදුනට වෙහෙර විහාර කරවූ බවත් මහාවංසය කියයි. මෙකී මහාවිහාරය තුළ වැඩ විසූ මහාසංඝරත්නය මුල් කාලයේ දී සසර විමුක්තිය අපේක්ෂාවෙන් සසුන් බඹසරෙහි හැසිරෙමින් කල් ගෙවූහ.

**මතු සම්බන්ධයි ....**

පසුගිය කලාපයේ මුද්‍රණ දෝෂ සහිත වචන කිහිපයක් මෙසේ නිවැරදි විය යුතුය
නිර්මාණය - creation / නිෂ්පාදනය produc-

## ඕස්ට්‍රේලියාවේ ලක්මිණී ද සිල්වා/ සමන්ත ද සිල්වා/ මයුර සෙනරත් මහත්ම මහත්මීන් ඇතුලු සැම වෙත,

ඔබ සැමගේ මහත් කැපවීමෙන් උපයනු ලැබූ රුපියල් පන්ලක්ෂ අසූදහස් අටසිය හතයි ශත පනහක මුදල අප වාලුකාරාම මහා විහාරස්ථනය වෙත ලැබුණු බව ශාසන දයාවෙන් යුතුව දන්වමි.

මේ සම්බන්ධව ඔබ හා එක්ව කටයුතු කල ඔබ හිතවතුන් සියලු දෙනාටම මා ඉමහත් ගෞරවයෙන් පිං පතමින් ආශිර්වාද කරමි.

ඔබ සියලුම දෙනා අවංකව ඉමහත් කැපවීමෙන් සිදු කරනු ලැබුවේ ජාතික සත්කාරයකි. ආගමික පිංකමකි. ජාතියක් හැටියට අනාගත දරු පරපුර බෞද්ධ සංස්කෘතිය යටතේ මනා ශික්ෂා කාමී මානව දයාවෙන් පිරි ශ්‍රේෂ්ඨ අභිමානයකින් යුතුව ගොඩනැගීමටය. මේ සඳහා දායක වූ සැම දෙනාම එහි කොටස් කරුවන් වෙති.

අප ජාතියට සහ ආගමට ඇති අභියෝග බොහෝය. එබැවින් අනාගත පරපුර නිසි මාවතකට යොමු නොකළ හොත් ඉදිරිය භයානකය. දහම් පාසල් තුලින් සිදුවන්නා වූ සේවය ඉතා ශ්‍රේෂ්ඨය. ඔබද දහම් පාසල් ජීවිතය ගත කළ අයකු ලෙස ධනාත්මකව සිතන්නට පෙළඹී ඇත. ජාතියට ආගමට භාෂාවට මානව ප්‍රජාව මෙන්ම අප ජීවත් වන ලෝකයට මිනිසා ආදරය කළ යුතුය. එවිටයි සෑම දෙනාටම ජීවත් විය හැක්කේ. තෘෂ්ණාව වෛරය සහ මෝහය අද මුලු මිහිතලය සිසිල් කිරීමට ඉමහත් පිටුවහලක් වී ඇත. මෙම උසස් කර්තව්‍ය තුලින් ඔබ සැම දෙනාම ජාති අගම් භේදයෙන් තොරව දායක වී ඇති බව සතුටින් දන්වමි. ඔබ එවූ මුදලින් බිල්ඩිමේ ඉදිරි කටයුතු කරගෙන යන්නෙමු. ඔබ සැමට තෙරුවන් බලෙන් නිදුක් නිරෝගී සැප ලැබේවයි ප්‍රාර්තනා කරමි.

විහාරාධිපති
පූජ්‍ය නෑගින්නේ අරියඤාන හිමි
වාළුකාරාමය - මෝසස් ලේන් කොරළවැල්ල, කටුකුරුන්ද මොරටුව

ලොව පුරා රටවල් 40ක ශ්‍රී ලාංකික ශ්‍රාවකයන් ගිය මාසයේ තිසර ගුවන් විදුලිය ඇසූ බව ඔබ දන්නවාද?

**ඕස්ට්‍රේලියාවේ හොඳම ජනවාර්ගික ගුවන්විදුලි වැඩසටහන චරිත සහ බෝයා ගෙනෙන "සිංහලෙන් පැය දෙකක්" දැන් සතියකට දින තුනක් තිසර ඔස්සේ අසන්න**

